සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 6 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය

**නම/විභාග අංකය :- ............................................................** **කාලය: පැය 02යි.**

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ශුද්ධ ස්වර දෙකක් පමණක් යෙදෙන ස්වර ස්ථාපන ගීතයකි.
(1) ගී ගයන මේ කුරුළු (2) එකට සතුටු සාගරේ
(3) ඈත ආකහේ පාට පාට මල් (4) කඳු පෙළ අතරේ තුරු වදුලේ

(02) උත්තර භාරතීය සංගීතය හඳුන්වන තවත් නමකි.
(1) පෙරදිග සංගීතය (2) බටහිර සංගීතය
(3) කර්ණාටක සංගීතය (4) හින්දුස්ථානි සංගීතය

(03) ආරෝහණ ක්‍රමයට අයත් ස්වර ඛණ්ඩය වනුයේ,
(1) ස ම ග රි (2) ප ම ග රි (3) ස ග ම ප (4) ම ග රි ස

(04) කඳු කඳු නැගෙනා .......................... යන ගී පාදයේ ලඝු ගුරු මාත්‍රා සංඛ්‍යාවල එකතුව වනුයේ,
(1) මාත්‍රා 08 කි. (2) මාත්‍රා 07 කි. (3) මාත්‍රා 05 කි. (4) මාත්‍රා 06 කි.


(05) නරිබෑණා නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ,
(1) ජෝන් ද සිල්වා මහතා ය. (2) චාල්ස් ඩයස් මහතා ය.
(3) දයානන්ද ගුණවර්ධන මහතා ය. (4) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.

(06) ළමා ගීතයක් වනුයේ,
(1) අද වෙස්සන්තර රාජ පුතා (2) සෙන්පතියන් ගැන
(3) මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ (4) සුවඳ පද්ම ඕලු ආදී

(07) සර්පිනාව පිළිබඳ නිවැරදි කියමන වනුයේ,
(1) තත් වාද්‍ය භාණ්ඩයකි. (2) බෝවෙන් වාදනය කරනු ලබයි .
(3) සුෂිර වාද්‍ය භාණ්ඩ ගණයට අයත් ය. (4) තාල වාද්‍ය භාණ්ඩයකි.

(08) මුරලි හා බන්සුරි යනුවෙන් වර්ග දෙකකින් යුත් වාද්‍ය භාණ්ඩයකි.
(1) ගිටාරය (2) බටනලාව
(3) තබ්ලාව (4) වයලීනය

(09) |ප-ප- |ම-ප ම | ග-ම ග | රි - - - | යන ස්වර පාදය ඇතුළත් ගී පාදය යි.
(1) සමනල පෙරහැර මුණසිරි පාදේ (2) තුටිනා බුදු ගී ගයනා ජනයා
(3) ගී නාදේ ගැමියා මවනා (4) ගංගාවේ හා වෙල් යායේ




(10) ඉහත ස්වර පුවරුවෙහි 2 3 4 5 යන අංක වලින් වාදනය කළ හැකි ස්වර වනුයේ,

(1) ස රි ග ම (2) ස රි ග ප

(3) රි ග ම ග (4) රි ග ම ප

(11) සඩ්ජය, ගන්ධාරය හා පංචමය යන ස්වර බටහිර සංගීතයේ දී පිළිවෙලින් හඳුන්වනුයේ,

(1) C, E, G (2) D, F, A

(3) E, G, C (4) E, C, G

(12) |x x xx x|x xx x x |මෙහි දැක්වනුයේ

(1) මාත්‍රා 3 රිද්ම රටාවයි. (2) මාත්‍රා 2 රිද්ම රටාවයි.

(3) මාත්‍රා 4 රිද්ම රටාවයි (4) මාත්‍රා 5 රිද්ම රටාවයි.

- අංක 13 සිට 16 දක්වා වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(13) ඇදෙන අකුරු ගුරු මාත්‍රා වේ. ( )

(14) ''සාර සදිසි පෙති පේර නෙළන කල'' යනු නෙළුම් ගීතය කි. ( )

(15) ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා ලයනල් එදිරිසිංහ මහතා වේ. ( )

(16) රංගනයට අදාළ ව සරල රිද්ම රටාවකට අනුව කළගෙඩි සෙල්ලමේ ගීත ගයනු ලබයි. ( )

- **අංක 17 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.**

( නූර්ති, බංකු රබාන, තබ්ලාව, කෙළි)

(17) .................................................. කොටස් දෙකකින් යුත් අවනද්ධ වාද්‍ය භාණ්ඩයකි.

(18) .................................................. ගී නළු නිළියන් විසින් ගයමින් ම රංගනයෙහි යෙදේ.

(19) ' දොඩම් කපාලා ඇඹුල් තනාලා' යනු .................................................. ගීයකි.

(20) 'උඩින් උඩින් වර පෙත්තප්පු' යන පදය වාදනයට උපයෝගී කරගනු ලබන්නේ ............................................. යි.

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **ඉතිරි ප්‍රශ්න වලින් කැමති ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(01) i) ස්වර සප්තකය ආරෝහණ සහ අවරෝහණ ක්‍රමයට ලියා දක්වන්න. (ලකුණු 2)

ii) ස, ග, ප, නි යන ස්වර සංකේත වල පෙරදිග ස්වර නාම සහ අපරදිග ස්වර සංකේත ලියන්න. (ලකුණු 4)

iii) ඔබ ඉගෙන ගත් ස්වර ස්ථාපන ගීතයක, ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 4)

(02) පහත ගී පද ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

★ වත ඒ පුන් සඳ මෙන් බබලාවී

★ එගොඩ ගොඩෙත් රත්තරන්

★ අග්ගල කං ඩෝං පුතා

★ අද වෙස්සන්තර රාජ පුතා

★ බැතිනා සිරිපා කරුණා කරනා

i) සිරිපා වන්දනාවේ යන විට ගයන ගී පාදය ලියා දක්වන්න.


ii) ..................................................... නූර්ති ගී පදයකි.

iii) කළගෙඩි නැටුමේ එන ගී පාදය ලියන්න.

iv) ස ස ග - | රි රි ම - | ග ග ප - | ම ධ ප - | ලෙස ස්වර යෙදෙන ගී පාදය තෝරා ලියන්න.

v) .............................................................. ලෙස යෙදී ඇත්තේ රබන් පදයකි. (ලකුණු 10)

(03) පහත දැක්වෙන්නේ ඔබ පන්තිකාමරයේ දී නිර්මාණය කරන ලද ආදේශ භාණ්ඩයකි.




i) මේ සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය 3ක් සඳහන් කරන්න. (ලකුණු 3)

ii) ඉහත ආදේශ භාණ්ඩයේ හඬ උපදවා ගන්නේ කෙසේද? (ලකුණු 2)

iii) ඉහළ හඬක් නිකුත් වන පට්ටමේ අක්ෂරය නම් කරන්න. (ලකුණු 1)

iv) පහළ හඬක් නිකුත් වන පට්ටමේ අක්ෂරය නම් කරන්න. (ලකුණු 1)

v) පහළ හඬක් නිකුත් වීමට හේතුව ලියන්න. (ලකුණු 3)

(04) පහත සඳහන් ස්වර අභ්‍යාසවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

i) | ස රි ස රි | ග - ග - | _ _ _ _ | ම - ම - |
| _ _ _ _ | ප - ප - | _ _ _ _ | _ _ _ _ |
| ප ධ ප ධ | _ _ _ _ | _ _ _ _ | _ _ _ _ |


ii) | ස රි ග - | ග රි ස - | _ _ _ _ | ම ග රි _ |
| _ _ _ _ | _ _ _ _ |

(ලකුණු 5)

iii) කෙළි ගී හා තුන් සරණේ ගී පිළිබඳ කරුණු 02 බැගින් ලියන්න. (ලකුණු 2)

iv) මාත්‍රා 4 රිද්ම රාටාවට අනුව ගැයෙන කෙළි ගීතයක් හෝ මාත්‍රා 3 රිද්ම රටාවට අනුව ගැයෙන තුන් සරණේ ගීතයක් ලියන්න. (ලකුණු 3)

(05) පහත සඳහන් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.



හරහට

2. ස්වර හත මෙ නමින් හඳුන්වයි.
6. දේශීය ජන ක්‍රීඩාවන් හා බැඳි ගීත වේ.
7. සංගීතයේ ප්‍රධාන මාධ්‍යය යි.
8. තත් හතරකි. බෝවෙන් වයයි.

පහළට

1. පාසලේ අනන්‍යතාවය මින් පිළිඹිබු වේ.
3. උච්ඡාරණය කිරීමට මාත්‍රා 03 ක කාලයක් ගතවන අක්ෂර වෙයි.
4. වාදනය කිරීම සඳහා පික් එකක් භාවිතා කරයි.
5. ගණිතමය හැකියා දියුණු කරන කාන්තාවන් සඳහා පමණක් සීමා වූ ජන ක්‍රීඩාවකි.
9. නරිබෑණා නාට්‍යයේ සත්ව චරිතයකි.
10. ස්වර පුවරු භාණ්ඩයක් වූ සර්පිනාවේ .................................................. හා සුදු යතුරු ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - පිළිතුරු පත්‍රය

I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 1 | (06) | 2 | (11) | 1 | (16) | ✓ |
| (02) | 4 | (07) | 3 | (12) | 3 | (17) | තබ්ලාව |
| (03) | 3 | (08) | 2 | (13) | ✓ | (18) | නූර්ති |
| (04) | 1 | (09) | 3 | (14) | × | (19) | කෙළි |
| (05) | 3 | (10) | 4 | (15) | × | (20) | බංකු රබාන |

(ලකුණු 20)

II කොටස

(01) (1) ආරෝහණ : ස රි ග ම ප ධ නි ස්
අවරෝහණ : ස් නි ධ ප ම ග රි ස

(2)

| | | |
|---|---|---|
| ස | සඩ්ජය | C |
| ග | ගාන්ධාරය | E |
| ප | පංචමය | G |
| නි | නිෂාධය | B |

(3) ගීත ස්වර ප්‍රස්ථාරය ලිවීම (ලකුණු 10))

(02) (1) අග්ගල කං ඩෝං පුතා
(2) අද වෙස්සන්තර රාජ පුතා
(3) වත ඒ පුන් සඳ මෙන් බබලාවී
(4) බැතිනා සිරිපා කරුණා කරනා
(5) එගොඩ ගොඩෙත් රත්තරන් (ලකුණු 10)

(03) (1) 'භාග පට්ටම්', යකඩ පටි, ඇලුමිනියම් පටි, ඝනත්වයෙන් වැඩි ලී කැබලි.
(2) තට්ටු තිරීමෙන්
(3) C
(4) A
(5) ලෝහ කැබලි/ ලී කැබලි දිග වැඩි වීම (ලකුණු 10)

(04) (1)

| | |
|---|---|
| රි ග රි ග | නි - නි - |
| ග ම ග ම | ධ නි ධ නි |
| ම ප ම ප | ස් - ස් - |
| ධ - ධ - | |

(2) රි ග ම -
ග ම ප -
ප ම ග -

(3) නිවැරදි කරුණු 2ක් බැගින් ලිවීම.

(4) රිද්ම රටාවට ගැළපෙන ගීතයක් ලිවීම. (ලකුණු 10)

(05)

| හරහට | පහළට |
| --- | --- |
| 2. සප්තකය | 1. පාසල් ගීතය |
| 6. කෙළි ගී | 3. ප්ලුත |
| 7. නාදය | 4. ගිටාරය |
| 8. වයලීනය | 5. ඔලිඳ කෙළිය |
| | 9. නරියා |
| | 10. කලු |

(ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - ප්‍රායෝගික පරීක්ෂණය

(01) ළමා ගී/ මව්පිය ගුණ වරුණ ගී - මෙම ගීත වර්ග වලින් කැමති ගීතයක් ගායනා කරන්න.

| **ලකුණු නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| ශ්‍රැතිය | 04 |
| නාද මාලාව | 04 |
| තාලය | 04 |
| මිහිරි බව | 04 |
| ප්‍රසංගාත්මක බව | 04 |
| | 20 |

(02) ඔබ ඉගෙන ගත් ස්වර ස්ථාපන ගීතයක් ගායනා කරන්න.

| **ලකුණු නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| ශ්‍රැතිය | 04 |
| නාද මාලාව | 08 |
| තාලය | 04 |
| මිහිරි බව | 04 |
| | 20 |

(03) කෙළිහි/ තුන් සරණේ ගී - මින් කැමති ගිතයක් ගායනා කරන්න.

| **ලකුණු නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| ශ්‍රැතිය | 04 |
| නාද මාලාව | 04 |
| තාලය | 04 |
| මිහිරි බව | 04 |
| ප්‍රසංගාත්මක බව | 04 |
| | 20 |

(04) නූර්ති ගී/ නව නාට්‍ය ගී (නරිබෑනා නාට්‍යයේ) - මින් කැමති ගීතයක් ගායනා කරන්න.

| **ලකුණු නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| ශ්‍රැතිය | 04 |
| නාද මාලාව | 04 |
| තාලය | 04 |
| මිහිරි බව | 04 |
| ප්‍රසංගාත්මක බව | 04 |
| | 20 |

(05) ස්වරබ පුවරු වාදනය - තමන් කැමති ඕනෑම ගිතයක් වාදනය කරන්න.

| **ලකුණු නිර්ණායක** | **ලකුණු** |
|---|---|
| නාද මාලාව | 04 |
| ඇඟිලි හැසිරවීම | 08 |
| තාලය | 04 |
| මිහිරි බව | 04 |
| | 20 |